# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 3 දරන
# ජාතික උරුම වනභූමි පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මාර්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 75 යි.　　　　තැපැල් ගාස්තුව: ශත 75 යි.

**1988 අංක 3 දරන ජාතික උරුම වනභූමි පනත**

[සහතිකය සටහන් කළේ 1988 මාර්තු මස 04 වන දින]

එල්. ඩී.—ඕ. 23/85

**ජාතික උරුම වනභූමි ප්‍රකාශයට පත්කිරීම සඳහාත්, ඒ වනභූමි ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම සඳහාත් ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 3 දරන ජාතික උරුම වනභූමි පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (1) අද්විතීය ස්වාභාවික ලක්ෂණයන්ගෙන් හෙබි පරිසර පද්ධති, ප්‍රවේණි සම්පත් හෝ භෞතික සහ ජෛව විද්‍යාත්මක ආවිතයන් ද, විද්‍යාවේ හෝ සංරක්ෂණයේ දෘෂ්ටි කෝණයට අනුව, කැපී පෙනෙන විශ්ව වටිනාකමකින් යුක්ත වූ ද, දුර්ලභවීමේ තර්ජනයට මුහුණ පා සිටින්නා වූ ද සතුන්ගේ සහ පැලෑටිවල වංශ භූමියෙන් සමන්විත වන නිශ්චිත ව විස්තර කොට දක්වා ඇති ප්‍රදේශ ද ඒවායේ ස්වාභාවික තත්ත්වයෙන් රැක ගැනීමේ සහ ශ්‍රී ලංකාවේ වන භූමිවල ස්වාභාවික සෞන්දර්යය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහාත් අද්විතීය ස්වාභාවික ලක්ෂණයන්ගෙන් හෙබි පරිසර පද්ධති, ප්‍රවේණි සම්පත් හෝ කැපී පෙනෙන කවර වුව ද ස්වාභාවික ලක්ෂණයන්ගෙන් යුක්ත ප්‍රදේශ වශයෙන් අමාත්‍යවරයා විසින් ස්වකීය අභිමතය පරිදි නිර්ණය කරනු ලබන කවර වුව ද රජයේ ඉඩම් ප්‍රදේශයක්, අමාත්‍යවරයා විසින්,— **ජාතික උරුම** වනභූමි ප්‍රකාශයට පත් කිරීම.

(අ) පරිසරය විෂයය භාර අමාත්‍යවරයාගේ ;

(ආ) වන සත්ව ආරක්ෂා විෂයය භාර අමාත්‍යවරයාගේ ;

(ඇ) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ ;

(ඈ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ ;

(ඉ) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ ; සහ

(ඊ) දේශීය වෛද්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ

එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයෙහි පළ කරන නියමයක් මගින්, ජාතික උරුම වන භූමි බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් ස්ථිර කර, එසේ අනුමත කර, ස්ථිර කරනු ලැබූ බවට නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, බලාත්මක නොවන්නේ ය.

(3) ජාතික උරුම වනභූමියක් බවට ප්‍රකාශයට පත් කරන ලද සෑම ප්‍රදේශයක් ම මිනුම්පතිවරයා විසින් නියම කොට දක්වා පිඹුරු පත් සකස් කළ යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන කවර හෝ නියමයක ඒ නියමයේ සඳහන් වන ප්‍රදේශය සඳහා මිනුම්පතිවරයා විසින් පිළියෙල කරන ලද පිඹුරු පතෙහි යොමුව සඳහන් කළ යුතු ය.

2—ඒ 099122—7,410 (87/09)

(4) (1) වන උපවගන්තියේ සඳහන් යම් අංග ලක්ෂණයක් ඇති රජයේ ඉඩමක් නොවන, යම් නිශ්චල දේපළක්, මේ පනතේ කාර්ය සඳහා අත්පත් කර ගැනීමට අවශ්‍ය වන්නාවූ ද, යෝජිත අත්පත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වූවක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගනු ලැබිය හැකි ය.

ජාතික උරුම වන භූමිවලට ඇතුළුවීම සීමා කිරීම.

3. (1) නිසි බලධරයා හැර අන් කිසිම තැනැත්තෙක්—

(අ) නිසි බලධරයාගේ උපදෙස් පිට හෝ ලිඛිත අවසරය ඇතිව යම් යම් නිල කාර්යයක් ඉටු කිරීම සඳහා ; හෝ

(ආ) නිසි බලධරයාගෙන් ලත් ලිඛිත අවසර පත්‍රයක බලය යටතේ සහ එහි ඇතුළත් කොන්දේසිවලට අනුකූලව හෝ

මිස, ජාතික උරුම කවර හෝ වනභූමියකට ඇතුළුවීම හෝ එහි රැඳී සිටීම හෝ නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් අවසරපත්‍රයක් නිසි බලධරයා විසින් නිකුත් කළ යුත්තේ ඒ සඳහා අයදුම් පතක් ඉදිරිපත් කළ විට, හෝ එහි වනසතුන් හෝ වෘක්ෂලතා හෝ නැරඹීමේ හෝ එම අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් විද්‍යාත්මක අධ්‍යයනයක් කරගෙනයාම හෝ සඳහා පමණකි.

ජාතික උරුම වනභූමි තුළ තහනම් වන ක්‍රියා.

4. (1) ජාතික උරුම වනභූමියක් තුළ කිසිම තැනැත්තකු විසින්—

(අ) කිසියම් පැළෑටියක් හෝ ගසක් හෝ එහි කොටසක් කැපීම ලකුණු කිරීම, කප්පාදු කිරීම, වටකපා පොතු ඉවත් කිරීම, ඉරීම, වෙනත් යමක් බවට පරිවර්තනය කිරීම හෝ ඉවතට ගෙනයාම සහ යම් දැව හෝ වෙනත් වන නිෂ්පාදන එක් රැස් කිරීම සහ ඉවත ගෙනයාම ;

(ආ) කිසියම් ගසක පොතු හෝ පත්‍ර පිහාමනා ඉවත් කිරීම නැත හොත් අන්‍යාකාරයකින් ගසකට හානි කිරීම හෝ අවහිර යක් කිරීම ;

(ඇ) තණකොළ කැපීම හෝ ගවයන්ට තණ කෑවීම ;

(ඈ) ජලය අපවිත්‍ර කිරීම ;

(ඉ) කිසියම් ශාකයක් ඉවතට ගෙනයාම, ඉදිරීම හෝ විනාශ කිරීම හෝ කිසියම් ශාකයකට හානියක් හෝ උපද්‍රවයක් කිරීම ;

(ඊ) කිසියම් ශාකයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නැතහොත් ඉදිරිපත් කිරීම ;

(උ) කිසියම් පක්ෂියකුට හෝ සතකුට වෙඩි තැබීම, කොටු කිරීම හෝ බොරුවළවල් කැපීම, උගුල් ඇටවීම, ගිපිනැර කිරීම හෝ ඩාඩා කිරීම ;

(ඍ) කිසියම් පක්ෂියකු හෝ සිව්පාවකු හෝ උරගයකු හෝ පක්ෂියකුගේ, සිව්පාවකුගේ නැතහොත් උරගයකුගේ යම් කොටසක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නැතහොත් ඉදිරිපත් කිරීම ;

(එ) කිසියම් පක්ෂියකුගේ හෝ උරගයකුගේ හෝ බිත්තර කිසිවක් ගැනීම හෝ විනාශ කිරීම හෝ කිසියම් පක්ෂියකුගේ කූඩුවක් ගැනීම හෝ විනාශ කිරීම ;

(ඒ) කිසියම් වල් සතකු කලබලයට පත් කරවන හෝ කලබලයට පත් කිරීමට ඉඩ ඇති පරිදි යම් තුවක්කුවකින් වෙඩි තැබීම හෝ වෙනත් ක්‍රියාවක් කිරීම හෝ එවැනි යම් සතකු බෝවන ස්ථානයට අවහිරයක් වන හෝ අවහිරයක් වීමට ඉඩ ඇති කිසියම් ක්‍රියාවක් කිරීම ;

(ඔ) කිසියම් සත්වයකුට හෝ ශාඛයකට හානි කිරීමේ හෝ සත්වයකු හෝ ශාඛයක් විනාශ කිරීමේ හෝ කාර්යය සඳහා යොදා ගත හැකි යම් බොරුවලක් හෝ කොටු කිරීමක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් හෝ විෂ සහිත ද්‍රව්‍යයක් හෝ සන්තකයේ තබා ගැනීම නැතහොත් පාවිච්චි කිරීම ;

(ඕ) තාවකාලික හෝ ස්ථිර යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ එසේ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක පදිංචිවීම ;

(ක) අලුතෙන් යම් හෙළිපෙහෙළි කිරීමක් සිදු කිරීම ;

(ග) ගිනි මෙළවීම, තබා ගැනීම හෝ ගෙනයාම ;

(ච) යම් වන නිෂ්පාදනයක් කිනම් ආකාරයකට හෝ ඉවත් කර ගෙන යාම ;

(ජ) වගා කිරීම හෝ වෙනත් කාර්යයක් හෝ, සඳහා කිසියම් භූමියක් හෙළිපෙහෙළි කිරීම හෝ හෑරීම ;

(ට) මාර්ගයක් ඉදි කිරීම ; හෝ

(ඩ) යම් බිත්තියක්, කාණුවක්, වැටියක්, වැටක්, බඩවැටියක්, මාවර වැටක් හෝ වෙනත් මායිම් සළකුණක් හානි කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම.

(2) මේ පනතේ කාර්ය සඳහා ජාතික උරුම වනභූමියක් ඇතුළත කිසි බලධරයා විසින් යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ එහි පදිංචිවීම (1) වන උපවගන්තියේ (ඕ) ඡේදයේ ඇතුළත් කිසිවක් මගින් වැළැක්වෙන සේ කියවා අර්ථකථනය නොකළ යුතු ය.

5. (1) අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කරුණු එනම්,— නියෝග.

(අ) ජාතික උරුම වනභූමි පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) ජාතික උරුම වනභූමියක් සම්බන්ධයෙන් 10 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද සමායෝජිත කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ; සහ

(ඈ) නියම කළ යුතු යැයි මේ පනතින් නියමිත සියලු කරුණු හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති සියලු කරුණු

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයෙහි සිට හෝ නියෝගවල නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකිතාක් ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම එය යටතේ ඒ දක්වා කරන ලද කිසිවකට හානියක් නොමැතිව අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**මේ පනතේ ඇතුළත් කිසිවක් සන්නද්ධ සේවාවක හෝ පොලිස් සේවයේ හෝ සාමාජිකයකු විසින් යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කෙරෙහි බල නොපෑ යුතු බව.**

6. මේ පනතේ ඇතුළත් කිසිවක්, සන්නද්ධ සේවාවක හෝ පොලිස් සේවයේ හෝ සාමාජිකයකු විසින්, යම් ලිඛිත නීතියක් මගින් ඔහු වෙත පැවරී ඇති, පැනවී ඇති හෝ භාරවී ඇති යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කෙරෙහි, බල නොපෑ යුතු ය :

එසේ වුවද සන්නද්ධ සේවාවල හෝ පොලිස් සේවයේ හෝ සාමාජිකයකු විසින් එවැනි යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා, හෝ ඉටු කිරීමෙහි ලා මේ පනතින් තහනම් කර ඇති යම් ක්‍රියාවක්, කිසියම් ජාතික වන භූමි ප්‍රදේශයක් තුළදී කරනු ලබන අවස්ථාවක, එවැනි ක්‍රියාවලට විරුද්ධව, අවශ්‍ය වන පියවර ගැනීම නිසි බලධරයාගේ කාර්යය විය යුතුය.

**වන සංරක්ෂක වරයා නිසි බලධරයා විය යුතු බව.**

7. වන සංරක්ෂකවරයා, මේ පනතේ කාර්ය සඳහා නිසි බලධරයා වන්නේ ය.

**නිසි බල ධරයාගේ කාර්ය.**

8. වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ජාතික උරුම වනභූමියක් හා සම්බන්ධයෙන් නිසි බලධරයා හට පහත සඳහන් කාර්යයන් භාර වන්නේ ය—

(අ) මේ පනතේ විධිවිධාන මගින් ඔහු වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීම ; සහ

(ආ) එම ජාතික උරුම වන භූමියකින් නිරීක්ෂණයක්, අධ්‍යයනයක් හා ආශ්වාදයක් ලැබිය හැකිවනු පිණිස අවශ්‍ය පහසුකම් සැපයීමට හෝ වැඩි දියුණු කිරීමට දිරි ගැන්වීම.

9. නිසි බලධරයාගේ කර්තව්‍ය ඉටු කිරීම හා සම්බන්ධයෙන් අවශ්‍යාවෝචිත යයි අමාත්‍යවරයාට පෙනී යන පොදු ස්වභාවයක වන විධාන අමාත්‍යවරයා විසින් නිසි බලධරයාට දිය හැකි අතර, නිසි බලධරයා ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

නිසි බලධරයාට විධාන දීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

10. (1) 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් බලාත්මක වූ දිනයෙන් පසුව, හැකිතාක් ඉක්මණින්, ඒ නියමය මගින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික උරුම වනභූමිය සම්බන්ධයෙන්, නිසි බලධරයා විසින්—

සමායෝජිත කළමනාකරණ සැලැස්ම.

(අ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ;

(ආ) වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුවේ ;

(ඇ) ධීවර දෙපාර්තමේන්තුවේ ;

(ඈ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ;

(ඉ) මධ්‍යම පරිසර අධිකාරියේ ;

(ඊ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ; සහ

(උ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ

සහාය ඇතිව සමායෝජිත කළමනාකරණ සැලැස්මක් පිළියෙල කළ යුතු ය.

(2) සමායෝජිත කළමනාකරණ සැලැස්ම පිළියෙල කරන ලද්දේ යම් ජාතික උරුම වනභූමියක් සම්බන්ධයෙන් ද, ඒ වනභූමිය තුළ ඒ සැලැස්ම නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර, වෙනත් ලිඛිත නීතියක පටහැනිව කවර වූ හෝ විධිවිධානයක කුමක් සඳහන්ව තිබුණ ද මේ පනතේ විධිවිධාන බලසහිත වන අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර කවර ගැටීමක් හෝ අනනුකූලතාවක් තිබුණ ද මේ පනතේ විධිවිධාන, ඒ අනෙක් ලිඛිත නීතියේ විධිවිධාන අභිබවා බලපැවැත්විය යුතු ය.

මේ පනත ලිඛිත නීතිය අභිබවා බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝනය වන ආකාරයෙන් ක්‍රියා කරන කවර හෝ තැනැත්තෙක් වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට නොඅඩු වූ ද රුපියල් විසි දහසකට නොවැඩි වූ ද දඩයකට හෝ හය මාසයක් දක්වා විය හැකි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

වැරදි හා දඬුවම්.

අර්ථ නිරූපණය.

**13.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතෙහි—

"වන සංරක්ෂකවරයා" යන්නෙන්, (451 වන අධිකාරය වූ) කැලෑ ආඥාපනතේ 58 වන වගන්තිය යටතේ පත් කරන ලද වන සංරක්ෂකවරයා අදහස් වේ ;

"වන නිෂ්පාදන" යන්නෙහි (451 වන අධිකාරය වූ) කැලෑ ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"ගස" යන්නෙහි, (451 වන අධිකාරය වූ) කැලෑ ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ; සහ

"දැව" යන්නෙහි, (451 වන අධිකාරය වූ) කැලෑ ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 ට ප්‍රථම දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.